# ලංකා වෙළඳ, කාර්මික සහ පොදු සේවක සංගමයේ (CMU) ප්‍රකාශය

**2023 මාර්තු 17 වන දින රජය ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පතක් ගැසට් කරන ලදී. යෝජිත ත්‍රස්ත විරෝධී පනත (ATA) 1979 කුප්‍රකට ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත (PTA) වෙනුවට ආදේශ කිරීමට අදහස් කරන අතර එහි භාවිතය සහ අපයෝජනය දේශීය හා ජාත්‍යන්තර හෙළාදැකීමට ලක් වී ඇත. සමස්තයක් ලෙස ගත් විට, ත්‍රස්ත විරෝධී පනත එමගින් ඉවත් කිරීමට උත්සාහ කරන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතට වඩා භයානකය.**

ත්‍රස්තවාදය පිළිබඳ ඉතා ලිහිල් හා පුළුල් නිර්වචනයක් සහිත යෝජිත පනත මගින් රැස්වීමේ නිදහස, සංවිධානය වීමේ නිදහස සහ ප්‍රකාශනයේ නිදහස ඇතුළු ජනතාවගේ මූලික සහ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් දැඩි ලෙස කප්පාදු කිරීම සඳහා ජනාධිපතිවරයාට සහ පොලිසියට පුළුල් බලතල ලබා දෙනු ඇත. ඉතා නරකම දෙය නම්, දැන් නීත්‍යානුකූල බොහෝ සාමකාමී ප්‍රජාතන්ත්‍රවාදී විරෝධතා ක්‍රියාවන 'ත්‍රස්තවාදී ක්‍රියා' ලෙස මෙම පනත අනුව ප්‍රකාශ කළ හැකි අතර එවැනි ක්‍රියාවන් සංවිධානය කිරීමට සහ ඒවාට සහභාගී වීමට සම්බන්ධ අය 'ත්‍රස්තවාදීන්' ලෙස නම් කර රඳවා තබා ගැනීමට, චෝදනා කිරීමට සහ සිරගත කිරීමට හෝ වසර ගණනාවක් 'පුනරුත්ථාපනය' කිරීම සඳහා යොමු කළ හැකි වීමයි.

ඇත්ත වශයෙන්ම, ත්‍රස්ත විරෝධී පනත ප්‍රජාතන්ත්‍ර විරෝධී පනතකි. ශිෂ්ට සමාජයක එවැනි පනතකට ඉඩක් තිබිය නොහැක. එය පාර්ලිමේන්තුව හරහා සම්මත කර ක්‍රියාත්මක කිරීමට විරුද්ධ විය යුතුය; එය පරාජය කළ යුතුය.

පනතේ පූර්විකාවේ, "ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවයට සහ භෞමික අඛණ්ඩතාවයට ත්‍රස්තවාදය බරපතල තර්ජනයක් වී ඇති හෙයින් සහ ශ්‍රී ලංකාවේ පුරවැසියන් මරණයට පත් කිරීම හා ඔවුන් වෙත බරපතල තුවාල සිදු කිරීමට හේතුව ඇති හෙයින්, ශ්‍රී ලංකාවේ රාජ්‍ය සහ පෞද්ගලික දේපළ වලට එමගින් බරපතල අලාභහානි සිදුවී ජාතික සංවර්ධනය මන්දගාමී වී ඇති හෙයින්ද..." යනුවෙන් සඳහන් වේ. අද ශ්‍රී ලංකාව අසාර්ථක සහ බංකොලොත් රාජ්‍යයක් බවට පත්ව ඇත්තේ ත්‍රස්තවාදය නිසා නොව රාජ්‍ය කටයුතු තිරසාර ලෙස කළමනාකරණය කරගැනීමට මෙතෙක් බලයට පත් වූ ජනාධිපතිවරුන් සහ ආණ්ඩු අසාර්ථක වීම සහ ඔවුන්ගේ අධීක්ෂණය යටතේ සිදු කරන ලද සහ ඔවුන් විසින් දිරිමත් කරන ලද මහා පරිමාණයේ දූෂණවල ප්‍රතිඵලයක් වශයෙනි. රජය විසින් ගෙවිය යුතු ණයවලට යම් සහනයක් ලබා ගැනීම සඳහා ඉල්ලා සිටින ඕනෑම දෙයක් කිරීමට කැමැත්තෙන් සිටින ජනාධිපති සහ ආණ්ඩුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ණයහිමියන් ඉදිරියේ දණින් වැටී සිටින නිසා අපගේ පරමාධිපත්‍යය වැරහැලි බවට පත් වී ඇත. අපගේ දුක්ඛිත තත්ත්වයෙන් අතිවිශාල ප්‍රතිලාභ ලබා ගැනීමට බලා සිටින කොල්ලකාරී ණය හිමියන්ට අපගේ අත්‍යවශ්‍ය සම්පත් කුණු කොල්ලයට විකිණීමට ආණ්ඩුව සූදානමින් සිටී. පැහැදිලිවම, ශ්‍රී ලංකාවට මේ, මොහොතේ, අවශ්‍ය වන්නේ ත්‍රස්ත විරෝධී පනතක් නොවේ.

ශීඝ්‍රයෙන් කඩාවැටෙන තම ජීවන තත්ත්වය ආරක්ෂා කර ගැනීම සඳහා අපමණ දුෂ්කරතාවලට මුහුණ දී සිටින අපේ බොහෝ ජනතාවට විරෝධතා ක්‍රියාමාර්ගවලට එළඹීමට සිදුවන බව ජනාධිපතිවරයා සහ ඔහුගේ ආණ්ඩුව දනී. ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පත පිටුපස ඇති සැබෑ චේතනාව ආණ්ඩුව විසින් ගනු ලබන ජනතා විරෝධී ප්‍රතිපත්තිවලට එරෙහිව ජනතාව වෙතින් පැනනගින ඕනෑම ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාමාර්ගයක් වැළැක්වීම හෝ මර්දනය කිරීමයි.

## ත්‍රස්ත විරෝධී පනත ප්‍රජාතන්ත්‍ර විරෝධී පනතකි!

රැඳවුම් නියෝගයක් නිකුත් කිරීමටත්, ඕනෑම පුද්ගලයෙකුව කිසිදු අධිකරණ විමර්ශනයකින් තොරව මාස 3ක් දක්වා රඳවා තබා ගැනීමටත්, මෙම පනත මගින් ඕනෑම නියෝජ්‍ය පොලිස්පතිවරයෙකුට (DIG) බලය ලබා දෙනු ඇත. ඉන් අනතුරුව, මහේස්ත්‍රාත්වරයෙකුගේ අනුමැතිය ඇතිව රැඳවුම් නියෝග වසරක් දක්වා දීර්ඝ කළ හැකි වනු ඇත. ජනතාවගේ නීත්‍යානුකූල විරෝධතාවලට පොලිසිය ප්‍රචණ්ඩ ලෙස ප්‍රතිචාර දක්වන ආකාරය සහ දේශපාලනඥයන් තම පෞද්ගලික අවශ්‍යතාවන් සඳහා පොලිසිය යොදා ගන්නා ආකාරය පිළිබඳ අපගේ මෑතකාලීන අත්දැකීම් සමඟ බලන කල පොලිසියට අධිකරණ බලය ලබා දීමේ බරපතල අනතුර අපි කල් තියා දකින්නෙමු.

තවද, ඕනෑම සංවිධානයක් "ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාවට අගතියක්" වන අයුරින් ක්‍රියා කරන්නේ යැයි විශ්වාස කිරීමට ජනාධිපතිවරයාට "සාධාරණ හේතු" ඇති විට, එම සංවිධානයට එරෙහිව තහනම් නියෝග නිකුත් කිරීමට මෙම පනත මගින් ජනාධිපතිවරයාට අසාමාන්‍ය බලයක් ලබා දෙනු ඇත. එපමණක් නොව, "රජයක් කටයුතු කිරීම නීතිවිරෝධී ලෙස වැළැක්වීමේ" අරමුණින් ක්‍රියා කරන හෝ "අත්‍යවශ්‍ය සේවාවන්ට බරපතල බාධා ඇති කරන" බවට සැක කරන ඕනෑම අයෙකුට එරෙහිව 'ත්‍රස්තවාදී ක්‍රියාවක්' සිදු කළ බවට චෝදනා කළ හැකිය. එවැනි පුළුල් නිර්වචන අනුසාරයෙන් ජනාධිපතිවරයා විසින් "අත්‍යවශ්‍ය" යැයි සලකනු ලබන ඕනෑම කර්මාන්තයක හෝ අංශයක වැඩ වර්ජන ක්‍රියාවක් ද 'ත්‍රස්තවාදී ක්‍රියාවක්' ලෙස සලකනු ලැබිය හැකිය. ගුරුවරුන්ගේ වෘත්තීය ක්‍රියාමාර්ගය කඩාකප්පල් කිරීම සඳහා අධ්‍යාපනය අත්‍යවශ්‍ය සේවාවක් බවට පත් කරන බවට ජනාධිපතිවරයා තර්ජනය කළ ආකාරය අපි පසුගිය දා දැක්කෙමු.

1972 අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභා පනත, 1971 සිට හදිසි නීති රෙගුලාසි සහ 1979 ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ඇතුළු සියලුම මර්දන නීතිවලට එරෙහිව සටන් කිරීමේ සාඩම්බර ඉතිහාසයක් CMU සතුව ඇත. ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කරගැනීමට පොදු අධිෂ්ඨානයකින් ක්‍රියා කරන අනෙකුත් සංවිධාන සමඟ අත්වැල් බැඳ ගනිමින් මෙම දුෂ්ට ත්‍රස්ත විරෝධී පනත පාර්ලිමේන්තුවේ සම්මත කිරීම නැවැත්වීමට අපි අපගේ සාමාජිකයින් බල ගන්වන්නෙමු. ඒ වගේම ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කිරීම වෙනුවෙන් අපි දිගටම සටන් කරන්නෙමු. මේ රටේ පවතින නීති ඕනෑම ත්‍රස්තවාදී තර්ජනයකට මුහුණ දීමට ප්‍රමාණවත් වේ. එනිසා, නව ත්‍රස්ත විරෝධී නීතියක් අපට, කොහෙත්ම, අවශ්‍ය නැත.

**ලංකා වෙළඳ, කාර්මික සහ පොදු සේවක සංගමය**